# ශ්‍රී ලංකාවේ අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තික අනුපාතය ආර්ථිකයට ඇතිකරනු ලබන බලපෑම

ඒ. ඩී. එන්. පී. අස්සැල්ල[1]

## සංක්ෂේපය

සේවා වියුක්තිකයන් යනුවෙන් හැඳින්වෙන්නේ, රැකියාවක් කිරීමට සුදානම්, රැකියාවක් සොයන, එහෙත් යෙදීමට රැකියාවක් නොමැති පුද්ගලයින් වන අතර ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති සංඛ්‍යාවේ ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් සේවා වියුක්ති අනුපාතය ඉහළ යනු දක්නට ලැබේ. වයස් මට්ටම, අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී/පුරුෂ භාවය, ප්‍රදේශය, පළපුරුද්ද අනුව සේවා වියුක්තිය වර්ග කිරීමේදී අධ්‍යාපන මට්ටම අනුව, අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තිය වාර්ෂිකව ඉහළ අගයක් ගැනීම කැපී පෙනෙන ලක්ෂණයකි. අධ්‍යාපනය සහ නිපුණතා වර්ධනය සඳහා වැය කෙරෙන මහජන මුදල් නිශ්ඵල වීම තුළින් ආර්ථිකයෙහි දීර්ඝ කාලීන ඍණාත්මක බලපෑම් ඇති වීම අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තිය හේතුවෙන් ඇතිවූ ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. මේ හේතුවෙන් අ.පො.ස උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තියට බලපාන හේතු සොයා බැලීමත් එමගින් ආර්ථිකයට ඇති කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීමත් මුලික අරමුණු විය. ඒ අනුව, 1990-2015 දක්වා කාල සීමාව තුළ ප්‍රකාශයට පත් කරනු ලැබූ වාර්ෂික මහ බැංකු වාර්තා සහ ජනලේඛන සහ සංඛ්‍යාලේඛන වාර්තා යන මුලාශ්‍රවල ද්විතියික දත්ත උපයෝගි කරගනිමින් කාලශ්‍රේණි විශ්ලේෂණය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් වගු ප්‍රස්තාර ඇසුරෙන් ලබාගත් දත්ත ඉදිරිපත් කරනු ලැබී ය. මේ අනුව 1990 වර්ෂයේදි 29.4%ව පැවති අ.පො.ස.උසස් පෙළ සහ ඊට ඉහළ සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගේ සේවා වියුක්තික අනුපාතය 2004 දී 16.8%ත්, 2010 දී 11.6% ත්, 2014 දී 8.1% ක අඩුවීමකුත් පෙන්නුම් කළ ද, 2015 වර්ෂයේදි 9.2% ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීමෙන් සමස්ත සේවා වියුක්තික අනුපාතයද 2014 වර්ෂයේ දී 4.3% සිට 2015 වර්ෂයේ දී 4.6% දක්වා වර්ධනය වී ඇත. මේ අනුව, ශ්‍රී ලංකාවේ තෘතීයික පිළිගත් අධ්‍යාපනික ආයතන විසින් ලබාදෙන විෂයමාලා නූතන ආර්ථිකය සරිලන ශිල්පීය දැනුම උත්පාදනය කළ හැකි තාක්ෂණික ක්‍රමවේදයක් ඉලක්ක කර නොගැනීමත්, තරුණ අපේක්ෂා සහ අවබෝධයත්, ඔවුන්ගේ දැනුමත්, කුසලතාවයත්, අපේක්ෂිත නිපුණත්වය මත ශ්‍රම ඉල්ලුම සහ ශ්‍රම සැපයුම අතර පවතින නොගැලපීම මෙම සේවා වියුක්තියට හේතු වී ඇති බව අවබෝධ විය. ඒ තුළින් තරුණ පිරිස අතර ඇතිවන සමාජ අසහනය ආර්ථික ඵලදායිතාවය අඩු කිරීමට හේතු වන බව අනාවරණය විය.

**මුඛ්‍ය පද :** සේවා වියුක්තිය, ආර්ථික ඵලදායිතාවය, අ.පො.ස. උසස් පෙළ

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nireshaassalla@gmail.com